# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2403/23 - 2024 සැප්තැම්බර් මස 25 වැනි බදාදා - 2024.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**පාර්ලිමේන්තු මැතිවරණය - 2024**

1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 ආ වැනි වගන්තිය

**තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන එම ඡන්ද පොළට ගොස් ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති තැනැත්තන්ට වෙනත් ඡන්ද පොළක දී ඡන්දය දීම සඳහා වූ පහසුකම්**

තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන, එම ඡන්ද මධ්‍යස්ථානයට ගොස් තමාගේ ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන්ට වෙනත් ඡන්ද මධ්‍යස්ථානයකදී ඡන්දය දීම සඳහා පහසුකම් සලසා දෙන ලෙස ඉල්ලුම් කළ හැකි ය. 1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 ආ වගන්තිය යටතේ ඒ සම්බන්ධ ප්‍රතිපාදන සලසා ඇත.

02. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත්‍ර සියලුම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී / දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල මෙන්ම ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරී කාර්යාලවලින් ලබා ගත හැකිය. නීත්‍යානුකූලව නාමයෝජනා දැන්වීමේ දින සිට එනම් 2024.09.24 දින සිට සතියක් ඇතුළත දී අදාළ ඉල්ලුම්පත් මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය, සරණ මාවත, රාජගිරිය යන ලිපිනයට එවිය යුතුය.

03. ඉල්ලුම්කරු පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී ලවා ඉල්ලුම් පත්‍ර සහතික කරවා ගත යුතු අතර ජාතික හැඳුනුම්පතේ අංකය ඉල්ලුම්කරු විසින් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කිරීම අවශ්‍ය වේ. ග්‍රාම නිලධාරී සහතිකය නොමැති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1A - EPG 6886 — 104 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. ඉල්ලුම්කරුවන් විසින් 2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පදනම් කරගෙන ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් තොරතුරු ඉල්ලුම්පත්වල සැපයිය යුතු අතර එම නාමලේඛන සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල/ කච්චේරිවල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හෝ මැතිවරණ කොමිෂන් සභාවේ www.elections.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක.

**ආර්. එම්. ඒ. එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. ඒ. පී. සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

EOG 09 - 190

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.